සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

32	S	I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ....

ව්‍යාපාර අධ්‍යයනය I

කාලය පැය දෙකයි

උපදෙස්

- ♦ සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ♦ ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- ♦ සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. පහත වගුවේ A සහ B වලින් පිළිවෙළින් නිෂ්පාදන අංශ හා ඒවායේ උප අංශ දැක්වේ.

A		B
X - කෘෂිකාර්මික අංශය	1.	බැංකු, රක්ෂණ, දේපළ වෙළඳාම්
	2.	විදුලිය, ගෑස්, ජලය
Y - කාර්මික අංශය	3.	පතල් හා කැනීම්
	4.	වන හා දැව කර්මාන්තය
Z - සේවා අංශය	5.	ධීවර කර්මාන්තය
	6.	ප්‍රවාහනය හා සන්නිවේදනය

A හා B නිවැරදිව ගැලපූ විට නිවැරදි කාණ්ඩය කුමක්ද?

1. X - 1, 3 Y - 2, 5, Z - 4, 6
2. X - 1, 2 Y - 3, 5, Z - 4, 6
3. X - 4, 5 Y - 2, 3, Z - 1, 6
4. X - 1, 5 Y - 2, 3, Z - 4, 6
5. X - 1, 2 Y - 2, 4, Z - 5, 6

(.....)

02. ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමට වඩාත්ම ඉවහල් වී ඇත්තේ,

1. ව්‍යාපාර කටයුතුයි.
2. පරිගණක තාක්ෂණයයි.
3. මුදල් හා බැංකුයි.
4. ගෝලීයකරණයයි.
5. වෙළඳපොළ තරඟයයි.

(.....)

03. පහත සඳහන් සිදුවීම හා ඊට අදාළ ව්‍යාපාර පරිසරය හා SWOT සමඟ නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

(අ) අහිතකර විෂ වායුවක් ආග්‍රහණය වීම හේතුවෙන් කම්හලේ සේවය කළ සේවකයෙකු මෙන්ම ඔහුව බේරා ගැනීමට ගිය අසල්වැසියන් කිහිපදෙනෙකුද මිය යාම හේතුවෙන් මධ්‍යම පරිසර අධිකරිය විසින් අදාළ කර්මාන්ත ශාලාවේ වැඩකටයුතු තහනම් කර ඇත.

(ආ) ජපානයේ ප්‍රසිද්ධ වාහන සමාගමක සේවක කණ්ඩායමක් විසින් තත්පර 60ක කාලයක් තුළදී ස්වයංක්‍රීයව කාර් රථයක් බවට පරිවර්තනය විය හැකි රොබෝ මිනිසෙකු නිර්මාණය කර ඇත. මෙමගින් එම ආයතනය ලොව පුරා ප්‍රසිද්ධිට පත්ව ඇත.

(ඉ) දීර්ඝ කාලයක් තිස්සේ සමාන මිලකට බනිජතෙල් අලෙවි කරමින් සිටි IOC සමාගම තෙල් මිල ඉහළ දැමීම හේතුවෙන් CEYPETCO සමාගම වෙත පාරිභෝගික ආකර්ෂණය ඉහළ ගොස් ඇත. CEYPETCO සමාගමට මෙය වාසිසහගත වී ඇත.

(ඊ) ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය හේතුවෙන් පරිසරයට වන හානිය පිළිබඳව රජයේ දැණුවක් කිරීම් වලට අනතුරුව කඩදාසි ඇසුරුම් භාවිතයට යොමුවීම නිසා එතෙක් කලක් ABC ආයතනයෙන් පොලිතීන් මිලට ගත් මහා පරිමාණ ව්‍යාපාර 5ක් ABC ආයතනයෙන් පොලිතීන් ඇණවුම් නවතා ඇත.

1. ආසන්න - තර්ජන 2. අභ්‍යන්තර - ශක්තීන් 3. ආසන්න - අවස්ථා 4. සාර්ව - තර්ජන

නිවැරදි පිළිතුර තෝරන්න.

1. අ-2, ආ-4, ඉ-1, ඊ-3
2. අ-3. ආ-4, ඉ-1, ඊ-2
3. අ-1, ආ- ඉ - ඊ
4. අ-4, ආ-2, ඉ-3, ඊ-1
5. අ-4, ආ-2, ඉ-1, ඊ-3 (.....)

04. පහත වගුව පිරවීමට අවශ්‍ය පද පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

නිර්ණායකය	හවුල් ව්‍යාපාර	පොදු සමාගම්	රාජ්‍ය සංස්ථා
1. අවම සාමාජික සංඛ්‍යාව	2	1	(අ) ....
2. ප්‍රාග්ධනය යෙදවීම	(ආ)	කොටස් කරුවන්	රජයේ ඒකාබද්ධ අරමුදල් හා ප්‍රදාන
3. නෛතික පුද්ගලභාවය	නැත	ඇත	(ඇ) ....
4. ලාභාලාභ බෙදීම	හවුල්කරුවන් අතර	(ඉ)	රජයේ ඒකාබද්ද අරමුදලට

1. (අ) - 2 (ආ) - හවුල්කරුවන් (ඇ) - ඇත (ඉ) - රජයට
2. (අ) - 1 (ආ) -හවුල්කරුවන් (ඇ) - ඇත (ඉ) - කොටස්කරුවන්ට
3. (අ) - 50 (ආ) - හවුල්කරුවන් (ඇ) - නැත (ඉ) - රජයට
4. (අ) - 20 (ආ) - හවුල්කරුවන් (ඇ) - නැත (ඉ) - රජයට
5. (අ) - 1 (ආ) - හවුල්කරුවන් (ඇ) - නැත (ඉ) - කොටස්කරුවන්ට (.....)

05. පහත සඳහන් වන්නේ SLS සහතිකය ලබාගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග ඇතුළත් කාර්යයන්ය.

(A) නියැදි පරික්ෂාව
(B) නිෂ්පාදන පූර්ව පරික්ෂාව
(C) අවසර ලත් කමිටුව මගින් පරික්ෂාව
(D) අයදුම් පත්‍රයේ ප්‍රමිති ආයතනයට ඉදිරිපත්කිරීම.
(E) කොන්දේසි නියම කිරීම.
(F) ප්‍රමිති ලාංඡනය පිරිනැමීම.

SLS සහතිකය ලබාගැනීමේ නිවැරදි පියවර පිළිවෙළින් ඇතුළත් පිළිතුරු තෝරන්න.

1. D, C, B, A, E, F
2. D, B, A, C, E F
3. D, E, A, C, B, F
4. D, B, A, E, C, F
5. A, B, C, E, F, D (.....)

06. පහත පිළිතුරු අතරින් රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සමාගම් පිළිබඳ නිවැරදිව ඉදිරිපත් කර ඇති ප්‍රකාශය තෝරන්න.

1. රජයේ දෙපාර්තමේන්තුවල අවම සාමාජික සංඛ්‍යාව එකක් වන අතර රාජ්‍ය සමාගම්වල අවම සාමාජික සංඛ්‍යාව 2කි.
2. රජයේ දෙපාර්තමේන්තුවලට හා රාජ්‍ය සමාගම්වලට අවශ්‍ය ප්‍රාග්ධනය වාර්ෂික අයවැය මගින් රජය විසින් පූර්ණව දරයි.
3. රජයේ දෙපාර්තමේන්තු එම දෙපාර්තමේන්වල ප්‍රධානියා මගින් කළමණාකරණය වන අතර රාජ්‍ය සමාගම් කළමණාකාරිත්වය කොටස්කරුවන් විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදුකරනු ලබයි.
4. රාජ්‍ය සමාගම් හා රජයේ දෙපාර්තමේන්තු යන දෙකටම නෛතික පුද්ගලභාවයක් ඇත.
5. රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සමාගම් යන දෙකෙහිම වගකීම සීමිත වේ. (.....)

07. පහත පිළිරු අතරින් හවුල් ව්‍යාපාරයක අනිවාර්යයෙන් පැවතිය යුතු ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ව්‍යාපාර කටයුත්තක් පැවතීම. නීතිමය පුද්ගලභාවයක් පැවතීම, අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වයක් පැවතීම, ලාභ ලැබීමේ අරමුණ.
2. හවුල් ගිවිසුමක් පැවතීම, අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය, හවුල් ගිවිසුමක් පැවතීම, අඛණ්ඩ පැවැත්ම
3. දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පුද්ගලයන් සිටීම, හවුල් ඔප්පුවක් පැවතීම, අඛණ්ඩ පැවැත්ම, ව්‍යාපාර කටයුත්තක් තිබීම.
4. අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය, ව්‍යාපාර කටයුත්තක් පැවතීම, හවුල් ඔප්පුවක් පැවතීම, ලාභ ලැබීමේ හෝ නොලැබීමේ අරමුණ
5. දෙදෙනෙකු හෝ ඊට වැඩි පුද්ගලයින් සංඛ්‍යාවක් සිටීම, ගිවිසුමක් තිබීම, අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය, ලාභ ලැබීමේ අරමුණ. (.....)

08. පහත වගුව නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

ව්‍යාපාර සංයෝජන වර්ග	හැඳින්වීම
1. සිරස් සංයෝජන	(අ) ව්‍යාපාර දාමයේ එකම අවස්ථාවක නිරත සමාගම් දෙකක් හෝ කිහිපයක් සංයෝජනය වීම.
2. තිරස් සංයෝජන	(ආ) ව්‍යාපාර දාමයේ විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම.
3. විෂම සංයෝජන	(ඉ) විවිධ ව්‍යාපාර කටයුතු වල නිරත සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම.

1. 1-අ, 2-ආ, 3-ඉ 2. 1-ආ, 2-අ, 3-ඉ 3. 1-ඉ, 2-ආ, 3-අ
4. 1-ආ, 2-ඉ, 3-අ 5. 1-ඉ, 2-ආ, 3-අ (.....)

09. පහත දක්වෙන්නේ ව්‍යවසායකත්වය තුළින් ලැබෙන ප්‍රතිලාභ කිහිපයකි.
A නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදාවීම.
B ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලැබීම.
C පෞද්ගලික මුල්‍යමය ලාභ
D සමාජ තත්වය හා පිළිගැනීම ඇතිවීම
E ආදායම් අවස්ථා බිහිවීම.
F නව රැකියා අවස්ථා උත්පාදනය වීම.
G ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම.
ඉහත දෑ අතුරෙන් සමාජයීය හා ආර්ථික ප්‍රතිලාභ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.
1. A, B, C, E 2. A, C, F, G 3. A, C, D, G 4. A, E, F, G 5. A, D, E, F (.....)

10. පහත සඳහන් දෑ අතුරෙන් විශේෂිත මුල්‍ය ආයතනයක් වන්නේ,
1. බලපත්‍රලාභී වාණිජ බැංකු 2. රක්ෂණ සමාගම් 3. බලපත්‍රලාභී විශේෂිත බැංකු
4. වණික් බැංකු 5. ලියාපදිංචි මුල්‍ය සමාගම් (.....)

11. මුල්‍ය සමාගම් මගින් ඉටු නොවන කාර්යයක් වන්නේ,
1. කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම. 2. දේපළ හා ඉඩම් වෙළඳම් කිරීම.
3. ඉල්ලුම් තැන්පතු භාර ගැනීම. 4. කාලීන තැන්පතු භාර ගැනීම.
5. රජයේ සුරැකුම්පත් වල ආයෝජනය. (.....)

12. පහත සඳහන් රේඛණ අතුරෙන් පැවරිය නොහැක්කේ කුමන රේඛණය අඩංගු චෙක්පතද?



1. 2. 3. 4. 5. (.....)

13. ගිණි රක්ෂණ ඔප්පුවක් යටතේ ගිනිහානිවලට අමතරව ආවරණය කරගත හැකි උවදුරු පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1. කැරලි කෝලාහල, සොරබිය, විදුලි ආපදා, භූමිකම්පා
2. කැරලි කෝලාහල, සොරබිය, මහජන වගකීම්, ව්‍යාපාරික අලාභ
3. භූමිකම්පා, කැරලි කෝලාහල, පිපිරීම්, ජල ගැලීම්
4. වැඩ වර්ජන, විදුලි ආපදා සුළි සුළං, කැරලි කෝලාහල
5. කැරලිකෝලාහල, ජල ගැලීම්, මහජන වගකීම්, සොරබිය. (.....)

14. සුධීර තමා සතු රු. ලක්ෂ 25ක් වටිනා රථය A, B යන රක්ෂණ සමාගම් 2හි පිළිවෙළින් ලක්‍ෂ 15කට හා ලක්‍ෂ 10 කට රක්ෂණය කරන ලදී. මෙය හඳුන්වන්නේ,
1. ප්‍රාරක්ෂණය ලෙසයි. 2. ප්‍රතිරක්ෂණය ලෙසයි. 3. ද්විත්ව රක්ෂණය ලෙසයි.
4. රක්ෂණය ලෙසයි. 5. වගකීම් රක්ෂණය ලෙසයි. (.....)

15. ප්‍රවාහනයෙන් නිසි ප්‍රයෝජන ලැබීමට නම් ප්‍රවාහන ගුණාංග නිසි අයුරින් ගැලපිය යුතුයි. ඒ අනුව හොඳ ප්‍රවාහන ක්‍රමයක් තිබිය යුතු ගුණාංග ඇතුළත් පිළිතුර තෝරන්න.
1. සුරක්ෂිත බව, පිරිවැය, නිවැරදි බව, පූර්ණ බව
2. සුලබතාව, පිරිවැය, පූර්ණ බව, ධාරිතාව
3. පිරිවැය, වේගවත්බව, ධාරිතාව, සුරක්ෂිතබව
4. වේගවත් බව, නිවැරදි බව, පූර්ණ බව, සුරක්ෂිත බව
5. පිරිවැය, සුරක්ෂිත බව, ධාරිතාව, සුලබතාවය (.....)

16. ව්‍යාපාර සංවිධානයක අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අදාළ ව්‍යාපාර කටයුතු කළමණාකරුවන් විසින් මෙහෙයවනු ලබන්නේ කළමණාකරණ මූලිකාංගවලට අනුවයි. අනුපිළිවෙළින් එම කළමණාකරන මූලිකාංග ඇතුළත් පිළිතුර වන්නේ,
1. සැලසුම් කිරීම, සංවිධානකරණය, පාලනය, මෙහෙයවීම.
2. සැලසුම්කිරීම, මෙහෙයවීම, සංවිධානකරණය, පාලනය
3. සැලසුම්කිරීම. සංවිධානකරණය, මෙහෙයවීම, පාලනය
4. සංවිධානකරණය, සැලසුම්කිරීම, මෙහෙයවීම, පාලනය
5. සංවිධානකරණය, මෙහෙයවීම, සැලසුම්කිරීම, පාලනය (.....)

17. පහත සඳහන් ඒවායින් මෙහෙයුම් කළමනාරණයට අයත් කාර්යයන් නොවන්නේ,

A මිල කිරීම	B බෙදාහැරීම
C නිෂ්පාදන සැලසුම්කරණය	D පර්යේෂණ හා සංවර්ධනය
E මහජන සම්බන්ධතා	F නිෂ්පාදන පාලනය

1. ABF 2. ABC 3. BDE 4. ABE 5. CDF (.....)

18. කාලානුරූපීව අලෙවිකරණ සංකල්ප වෙනස්වූ අතර එකී විකාශනය තුළ හමුවන ''අලෙවිකරණ සංකල්පයට'' අදාළ නොවන්නේ මින් කුමක්ද?
1. පාරිභෝගික අවශ්‍යතා හඳුනාගැනීම.
2. උපරිම මට්ටමකින් පාරිභෝගිකයාට සේවය කිරීම.
3. උපරිම කාර්යක්‍ෂමතාවයකින් යුක්ත ගුණාත්මක නිෂ්පාදිත නිපදවීම.
4. ප්‍රවර්ධනයට මුල්තැන දී පාරිභෝගිකයාව පොළඹවා ගැනීම.
5. අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් නොවූ පාරිභෝගිකයින් පැහැදිළිව හඳුනා ගැනීම. (.....)

19. පහත සඳහන් ඒවායින් ඒකක භාරයට අදාළ නොවන්නේ කුමක්ද?
1. ඒකක භාර අරමුදලක ආයෝජනය රුපියල් 1000 ගුණිතවලින් කළයුතු වීම.
2. ආයෝජකයන්ගෙන් එකතුකරගත් මුදල් සංචිතයක් වීම.
3. ඒකකයක නාමික අගය රු. 1000 කි.
4. එකතුකරගත් මුදල්, ආයෝජන කළඹක ආයෝජනය කිරීම.
5. ඒකක භාරයක් ප්‍රධාන පාර්ශව තුනකින් සමන්විත වීම. (.....)

20. අනෙකුත් සම්පත්වලට සාපේක්ෂව මානව සම්පතෙහි ඇති සුවිශේෂී ලක්ෂණයක් නොවන්නේ,
1. අනෙකුත් සම්පත් පාලනය කළහැකිවීම. 2. සජීවී බව.
3. ප්‍රතික්‍රියා දක්විය නොහැකි බව. 4. පුහුණුකළ හැකි බව.
5. කණ්ඩායම් වශයෙන් කටයුත කළ හැකි බව. (.....)

21. දත්ත සැකසුම් ක්‍රියාවලියේ කාර්යයක් නොවන්නේ,
1. දත්ත තේරීම. 2. දත්ත වර්ගීකරණය 3. දත්ත සාරාංශකිරීම.
4. දත්ත එක්රැස් කිරීම. 5. දත්ත ගණනය කිරීම් සිදුකිරීම. (.....)

22. පහත සඳහන් වෙළෙඳ කලාප අතරින් ශ්‍රී ලංකාවට සම්බන්ධ වෙළෙඳ කලාපය තෝරන්න.
1. යුරෝපා සංගමය 2. උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ සංගමය (NAFTA)
3. යුරෝපා නිදහස් වෙළඳ ගිවිසුම (EFTA) 4. බිම්ස්ට්-එක් (BIMST-EC)
5. ආසියාන් සංගමය (ASEAN) (.....)

23. භාවිතාකරන විවිධ මට්ටම් අනුව තොරතුරු පද්ධති වර්ගීකරණයක් නොවන්නේ,
1. කළමණාකරණ මට්ටමේ තොරතුරු පද්ධති. 2. අලෙවිකරණ මට්ටමේ තොරතුරු පද්ධති.
3. දැනුම් මට්ටමේ තොරතුරු පද්ධති. 4. උපක්‍රමික මට්ටමේ තොරතුරු පද්ධති.
5. මෙහෙයුම් මට්ටමේ තොරතුරු පද්ධති. (.....)

24. අනාගත මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීමේදී සලකා බලන සාධකයක් නොවන්නේ,
1. අනාගත සේවක විශ්‍රාමයාම්. 2. ඉල්ලා අස්වන සේවක ප්‍රමාණය
3. අනාගත ව්‍යාපෘති. 4. පසුගිය මූල්‍ය වාර්තා
5. සේවය අවසන් කිරීම්. (.....)

25. ව්‍යාපාරයේ ඉලක්ක ගත අරමුණු හා පරමාර්ථවලට ළඟාවීම සඳහා ආයතනයක් සතු සම්පත් භෞතික, මානව හා මූල්‍ය සම්පත් සම්බන්ධීකරණය කිරීමේ කළමනාකරණ මූලිකාංගය හඳුන්වන්නේ,
1. සැලසුම්කරණය ලෙසිනි. 2. මෙහෙයවීම ලෙසිනි. 3. පාලනය ලෙසිනි.
4. සංවිධානකරණය ලෙසිනි. 5. කළමණාකරණය ලෙසිනි. (.....)

26. නිෂ්පාදිතයක් වෙළෙඳපොළට ඉදිරිපත් කරන මට්ටම් අනුපිළිවෙළින් දැක්වෙන කාණ්ඩය තෝරන්න.
1 මූලික නිෂ්පාදිතය/මූලික ප්‍රතිලාභය/අපේක්ෂිත නිෂ්පාදිතය/වර්ධිත නිෂ්පාදිතය/විභව නිෂ්පාදිතය
2. මූලික ප්‍රතිලාභය/මූලික නිෂ්පාදිතය/වර්ධිත නිෂ්පාදිතය/අපේක්ෂිත නිෂ්පාදිතය/විභව නිෂ්පාදිතය
3. අපේක්ෂිත නිෂ්පාදිතය/මූලික ප්‍රතිලාභය/මූලික නිෂ්පාදිතය/වර්ධිත නිෂ්පාදිතය/විභව නිෂ්පාදිතය
4. මූලික ප්‍රතිලාභය/මූලික නිෂ්පාදිතය/අපේක්ෂිත නිෂ්පාදිතය/වර්ධිත නිෂ්පාදිතය/විභව නිෂ්පාදිතය
5. මූලික නිෂ්පාදිතය/මූලික ප්‍රතිලාභය/වර්ධිත නිෂ්පාදිතය/විභව නිෂ්පාදිතය/අපේක්ෂිත නිෂ්පාදිතය (.....)

27. මානව සම්පත් කළමණාකරණයේ කාර්යයක් නොවන්නේ,
1. ගෙවීම් කළමනාකරණය 2. බඳවාගැනීම. 3. ආකර්ෂණය
4. අනුස්ථාපනය 5. සේවක වැඩවර්ජන මෙහෙයවීම. (.....)

28. පහත සඳහන් වන්නේ අලෙවි සැලැස්මට හා මෙහෙයුම් සැලැස්මට අයත් කාර්යයන් වේ.
(A) අලෙවි සැලැස්ම : 1. ස්ථාවර වත්කම් අවශ්‍යතා
2. තරගකරුවන්ගේ අලෙවි උපායමාර්ග
3. අපේක්ෂිත අලෙවි වියදම්
4. නිෂ්පාදන පිරිවැය
(B) මෙහෙයුම් සැලැස්ම : 5. වාර්ෂික විකුණුම් පුරෝකථන
6. යොදාගන්නා තාක්ෂණය
7. ඉලක්ක වෙළෙඳපොළ
8. අමුද්‍රව්‍ය අවශ්‍යතාවය හා තොග පාලනය
නිවැරදි පිළිතුර ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1. A - 2, 3, 5, 8 / B - 1, 4, 6, 7 2. A- 2, 3, 5, 7 / B - 1, 4, 6, 8
3. A - 2, 4, 5, 6 / B - 1, 3, 7, 8 4. A - 1, 2, 3, 7 / B - 4, 5, 6, 8
5. A - 2, 3, 6, 7 / B - 1, 4, 5, 8 (.....)

29. හොඳ මුදලක ලක්ෂණ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1. හුවමාරු මාධ්‍යයක් වීම / කල් පැවැත්ම / වටිනාකමේ සන්නිධියක් වීම / පොදු පිළිගැනීම
2. වටිනාකමේ මිම්මක් වීම / අනුකරණයේ දුෂ්කරතාව / කල් පැවැත්ම / කුඩා කොටස් වලට බෙදිය හැකි වීම.
3. හුවමාරු මාධ්‍යයක් වීම / වටිනාකමේ මිම්මක් වීම / වටිනාකමේ සන්නිධියක් වීම / කුඩා කොටස්වලට බෙදිය හැකිවීම.
4. කල් පැවැත්ම / පොදු පිළිගැනීම / කුඩා කොටස්වලට බෙදිය හැකිවීම / අනුකරණයේ දුෂ්කරතාව
5. කල් පැවැත්ම / පොදු පිළිගැනීම / හුවමාරු මාධ්‍යයක් වීම / අනුකරණයේ දුෂ්කරතාව. (.....)

30. සන්නමක් ලියාපදිංචි කර නීත්‍යානුකූල තත්ත්වයක් ලබාගත්විට එය හඳුන්වන්නේ,
1. වෙළෙඳ ලකුණ ලෙසය.
2. සන්නම් ලාංඡනය ලෙසය.
3. සන්නම් නාමය ලෙසය.
4. පවුල් සන්නම් නාමය ලෙසය.
5. සන්නම් පක්ෂපාතීත්වය ලෙසය. (.....)

*** අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. (අ) ව්‍යාපාරයක ආරම්භයට හා පැවැත්මට අවශ්‍ය අභ්‍යන්තර පාර්ශවය .... වන අතර ව්‍යාපාරයේ පැවැත්මට අදාළ බාහිර පාර්ශවයක් වන්නේ ....ය.

(ආ) අන්තර්ජාල තාක්ෂණය උපයෝගීකරගෙන සිදුකරන ඕනෑම ව්‍යාපාර ක්‍රියාවලියක් හැඳින්වනුයේ .... ලෙසය.

32. (අ) .... හා .... යනු ව්‍යාපාර ආචාර ධර්ම වලට පටහැනිව ව්‍යාපාර ක්‍රියාත්මක වන ආකාරවලින් 2කි.

(ආ) පාරිභෝගික ආරක්ෂාව ලබාදීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය .... දරණ පණත යටතේ ද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය .... පනත යටතේද පිහිටුවා ඇත.

33. (අ) භාණ්ඩ හා සේවා විකිණීමෙන් කොමිස් මුදලක් උපයන තොග වෙළෙන්දා ....

....

(ආ) නිදහස් වෙළඳාමට ඇති බාධක .... බාධක හා .... බාධක වශයෙන් හැඳින්වේ.

34. (අ) ලැබිය යුතු ණය විකුණා මුදල් ලබාගැනීම .... ලෙස හැඳින්වේ.

(ආ) ප්‍රාග්ධන තෝලනය (1) .... (2) ....

හා (3) .... ලෙස කොටස් තුනක් යටතේ විග්‍රහ කළ හැකිය.

35. විදුලි සීනුව ආයතනයේ .... සන්නිවේදනයක් වන අතර එය .... සන්නිවේදන ක්‍රමයක් ලෙස සැලකේ.

36. තම කණ්ඩායම් සාමාජිකයන්ට හෝ කාර්යබාර සුපරික්ෂකට සිය කටයුතු පිළිබඳ ප්‍රතිඵල වාර්තාකිරම හා අපේක්ෂිත මට්ටමට වඩා එම ප්‍රතිඵලය අඩුනම් එයට හේතු ඉදිරිපත් කිරීම (අ) .... ලෙස හඳුන්වන අතර, ව්‍යාපාරයේ ඉලක්ක ලඟාකරගැනීමට ක්‍රියාකිරීම හා සම්පත් බෙදා වෙන්කර දීමට අදාළ බලය (ආ) .... හැඳින්වේ.

37. සංවිධානයේ සමස්ථය දකින අග්‍ර කළමණාකරුවකු සතු හා ප්‍රගුණ කළයුතු කුසලතා (අ) .... කුසලතා වන අතර පළමු මට්ටමේ කළමණාකරුවන් තුළ වැඩි වශයෙන් පැවතිය යුතු කුසලතා (ආ) .... කුසලතා වේ.

38. (අ) යම් කාර්යයක නියලී සිටින සේවක කණ්ඩායම් කුඩා කණ්ඩායම් වශයෙන් එක්වී සාකච්ඡා මගින් ඔහුනොවුන් මුහුණපාන ගැටළු හඳුනාගන්නා ශිල්ප ක්‍රමය .... ලෙස දැක්විය හැකිය.

(ආ) වර්ථමානයේ පුවත්පත් දැන්වීම් ආදිය පලකරමින් රැකියා සඳහා පුද්ගලයින් අද්දවා ගැනීමේ ක්‍රියාවලිය .... ලෙස හඳුන්වනු ලබයි.

39. (අ) ද්විත්ව භාජන ක්‍රමයට අනුව විශාල භාජනයේ ද්‍රව්‍ය අවසන්වීම .... මට්ටමට නිදසුන් ලෙස දැක්විය හැකිය.

(ආ) භාණ්ඩ ඇණවුම්කළ අවස්ථාවේ සිට ඒවා ගබඩාවට ලැබෙනතෙක් කාලය .... ලෙස හැඳින්වේ.

40. (අ) කිසියම් විකුණුම්කරුවෙකු විකිණීමට ඉදිරිපත් කරන නිෂ්පාදිත කට්ටලට .... ලෙස හඳුන්වයි.

(ආ) නිෂ්පාදිතයක මිල, ගුණය, සහ සේවාව යන කරුණුවල සංයෝජනය .... ලෙස හඳුන්වයි.

❖ **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. පහත සඳහන් ව්‍යාපාර ක්ෂේත්‍රවලට නියාමනය ලබාදෙන ආයතන නම් කරන්න.

1. කොටස් වෙළෙඳපොළ ....
2. මගී ප්‍රවාහන සේවා ....
3. රක්ෂණ කර්මාන්ත ....
4. රූපවාහිනී නාලිකා ....

42. ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර සඳහා විවිධ දිරිගැන්වීම් ලබාදෙන ආයතන 4ක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

43. විදේශ වෙළඳාමේදී භාවිතා කරන ලියවිලි 4ක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

44. නිෂ්පාදිතයක ජීවන චක්‍රයක අදියර අනුපිළවෙළින් ලියා දක්වන්න.

1. .... 2. ....
3. .... 4. ....

45. කොටස්වල ආයෝජනය කරන්නෙකුට ලබාගතහැකි ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

46. ව්‍යාපාර සංවිධානයක් මූල්‍ය පාලනය සඳහා යොදාගන්නා මූල්‍ය පාලන උපකරණ හතරක් නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

47. මානව සම්පත් සැලසුම්කරණය මගින් ආයතනයකට අත්පත්කරගත හැකි ප්‍රයෝජන 4ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

48. භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ග 4ක් සඳහන් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

49. පරිගණක එකිනෙකට සම්බන්ධ වී ඇති ආකාරය අනුව පරිගණක ජාල වර්ග 4ක් දක්වන්න.

1. ....

2. ....

3. ....

4. ....

50. ව්‍යාපාර සැලැස්මක අඩංගු පුරෝකථනය කළ මූල්‍ය තත්ව ප්‍රකාශයක අඩංගු වියයුතු කරුණු 4ක් දක්වන්න.

1. ....

2. ....

3. ....

4. ....

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

32 | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

ThirdTerm Test - Grade 13 - 2018

විභාග අංකය .... වයාපාර අධ්‍යයනය II කාලය පැය තුනයි

උපදෙස්

♦ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

I කොටස

01. (i) (අ) ව්‍යාපාරයක් අවදානම් දරමින් ලාභ ලැබීමට උත්සාහ කළද ව්‍යාපාරයේ එකම අරමුණ ලාභ ලැබීම නොවන බව කිව හැකිය.
ඉහත ප්‍රකාශයට ඔබ එකඟවන්නේද? එසේනම් ව්‍යාපාරයක් ලාභ ලැබීමට අමතරව අපේක්ෂා කරන දෑ පිළිබඳව විස්තරයක් සපයන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාරයක අරමුණුවල පැවතිය යුතු ගුණාංග හතරක් නම් කරන්න. (ලකුණු 2)

(ii) (අ) ''ව්‍යාපාරවලය වඩා වැදගත් වන්නේ අවශ්‍යතා නොව වුවමනාය'' ඉහත ප්‍රකාශය විමසන්න. (ලකුණු 2)
(ආ) විද්‍යුත් වාණිජ්‍යයේ වේගවත් ප්‍රසාරණයට බලපා ඇති හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) (අ) ව්‍යාපාර අපේක්ෂාවන් යනු මොනවාද? (ලකුණු 2)
(ආ) ව්‍යාපාරයක සාර්ථකත්වය හෝ අසාර්කත්වය තීරණය වීමට ව්‍යාපාර පරිසරය බෙහෙින් ඉවහල් වේ. ව්‍යාපාර පරිසරය යන්න නිවැරදිව හඳුන්වා එය ගැලීම් සටහනක දක්වන්න. (ලකුණු 2)

(iv) (අ) හන්සි පසුගිය වසරේදී අ.පො.ස. උ/පෙළ විභාගයට පෙනී සිටි අතර විශ්ව විද්‍යාල අධ්‍යාපනයට වරම් නොලැබිණි. ඇයගේ පියා විදෙස්ගතව සේවය කරන අතර ඔහුගේ අදහස වූයේ තම නිවස වයඹ විශ්ව විද්‍යාලයට ඉතා ආසන්නයේ ප්‍රධාන පාරට මායිම්ව පිහිටා ඇති නිසා විශ්ව විද්‍යාල සිසුන්ට අවශ්‍ය කරන ලිපිද්‍රව්‍ය, ඡායා පිටපත් හා ව්‍යාපෘති සැලසුම් ආදිය පිළියෙල කරදීමට හැකි ලිපි ද්‍රව්‍ය කඩයක් හන්සිට නිවසේම ආරම්භ කිරීමටයි. මෙම ව්‍යාපාරයට අදාළ විය හැකි ව්‍යාපාර පරිසරයන් උපකල්පනයන් හා උදාහරණයන් තුළින් දක්වන්න. (ලකුණු 2)
(ආ) එම ව්‍යාපාරයට අදාළ ශදුඅත විශ්ලේෂණයක් කරන්න. (ලකුණු 2)

(v) මුල්‍ය සමාගමක් විසින් තම ගනුදෙණුකරුවන්ට වංචා කිරීමේ පුවතක් පිළිබඳව පසුගිය දිනවල මාධ්‍ය මගින් කථාබහට ලක්විය. ව්‍යාපාරයක් යනු සමාජ වගකීම් ඉටුකිරීමට බැඳී සිටින ආයතන බව මෙම අවස්ථාව ගැල සලකා බැලූ විටද පෙනී යයි. මුල්‍ය සමාගමක් පහත පාර්ශවයන්ට සමාජ වගකීම් ඉටුකළ යුතු ආකාරය පෙන්වා දෙන්න. කරුණු 2 බැගින් සපයන්න.
- ගණුදෙනුකරුවන්
- සේවකයින්
- අයිතිකරුවන්
- සමාජය

(ලකුණු 4)

02. (i) මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී රජය ප්‍රමාණාත්මක හා ගුණාත්මක ණය සීමා පැනවීම සිදුකරයි.

(අ) ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම හා ගුණාත්මක ණය සීමා පැනවීම වෙන් වෙන්ව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ගුණාත්මක ණය පාලනය ව්‍යාපාර කෙරෙහි කවර බලපෑමක් කරන්නේද? (ලකුණු 2)

(ii) පාරිභෝගික ජාත්‍යන්තරයට අනුව පාරිභෝගික වගකීම් 4ක් නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා බිහිවී ඇති ව්‍යාපාර සංවිධාන විවිධ නිර්ණායක මත බෙදා දැක්විය හැකිය. එවන් නිර්ණායකයන් 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) අළුතින්ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවෙන් සිටින ව්‍යවසායකයකු වන කමල් තමාගේ ව්‍යාපාර අදහස ව්‍යාපාරයක් බවට සිදුකිරීමේදී තෝරාගත යුතු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්විය යුතුදැයි ඔබෙන් විමසයි. යෝග්‍ය ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරාගැනීමේදී සැලකිල්ල දැක්විය යුතු කරුණු මොනවාදැයි දක්වන්න. (ලකුණු 2)

(iv) (අ) 2007 අංක 7 දරණ සමාගම් පණතේ 32 සිට 35 දක්වා වගන්ති ඇපයෙන් සීමිත සමාගම්වලට අදාළ වේ. ඇපයෙන් සීමිත සමාගමක් යනු කුමක්ද? (ලකුණු 2)

(ආ) සමුපකාර ව්‍යාපාරයද තරඟකාරී මුහුණුවරක් ගනිමින් තම ව්‍යාපාර ලොව තුළ ප්‍රචලිත කිරීමට සමත්ව ඇති ව්‍යාපාර සංවිධාන විශේෂයකි. සමුපකාර ව්‍යාපාරය යනු කුමක්ද? (ලකුණු 2)

(v) (අ) සීමාසිත පොදු සමාගමක් හා සීමාසහිත පෞද්ගලික සමාගමක් අතර බොහෝ සමානතා දැකිය හැකිය. එවන් සමානතා 4ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර පවත්නා සම්බන්ධතාව පැහැදිලි කරන්න.(ලකුණු 2)

03. (i) (අ) ව්‍යවසායකත්වය සාර්ථක වීම සඳහා අවශ්‍යයෙන්ම තිබිය යුතු සාධක 4ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යවසායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 8ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) (අ) කුඩා ව්‍යාපාර ආරම්භ කිරීමේදී සැලකිලිමත් වියයුතු කරුණු 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යවහාර මුදල් හා බැංකු මුදල් අතර වෙනස්කම් 4ක් දක්වන්න. (ලකුණු 2)

(iii) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට අද දක්වා මුදලේ විකාශනයේ ප්‍රධාන අවස්ථා නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) (අ) හර කාඩ්පත් භාවිතා කර ගනුදෙනු කිරීම තුළින් ගනුදෙනුකරුට අත්වන වාසි 4ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) වාණිජ බැංකු විසින් ව්‍යාපාර සඳහා විවිධ සේවාවන් රාශියක් ඉටු කරයි. එවැනි සේවාවන් 4ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

(v) (අ) අවදානම් ඒකරාශීකරණය මත රක්ෂණය පදනම් වී ඇත රක්ෂණීය අවදානම යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.. (ලකුණු 2)

(ආ) ගිනි රක්ෂණය යටතේ අනුශාංගික අලාභ රක්ෂණය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

04. (i) (අ) නැව් බඩු රක්ෂණයට අයත් වන්නාවූපහත ඔප්පු වර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

1. ඇගයූ ඔප්පුව 2. අනාගතාවරණ ඔප්පුව (ලකුණු 2)

(ආ) ව්‍යාපාර සේවාවක් පමණක්ම නොව සමාජීය අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස පෙනී සිටින ප්‍රවාහනයේ කාර්යක්ෂමතාවය සඳහා ප්‍රවාහන මාර්ග සංවර්ධනය ප්‍රමාණවත් වේද? මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 2)

(ii) (අ) ප්‍රවාහනය ව්‍යාපාරිකයන් හට විශාල සේවාවක් සැපයුවද සමාජ පිරිවැය මත සමාජයට අහිතකර ප්‍රතිඵල රාශියක් ගෙන දෙයි. මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ''පුළුල් පරාසයක් ආවරණය කරමින් සකස් කරනු ලබන පරිගණක ජාලය අන්තර් ජාලයයි'' අන්තර්ජාල බාවිතයෙන් වයාපාරිකයකුට අත්වන ප්‍රයෝජන දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) භාණ්ඩ හා සේවා හුවමාරුවේදී බාවිතාකරන ප්‍රධාන අතර මැදියන් දෙවර්ගය නම් කරන්න. (ලකුණු 2)

(ආ) ප්‍රති අපනයනය හා අන්තර් වෙළෙඳම කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

(iv) දේශීය වෙළෙඳම හා විදේශීය වෙළඳම අතර වෙනස්කම් 4ක් දක්වන්න. (ලකුණු 4)

(v) (අ) ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ සිල්ලර වෙළෙන්දන් මුහුණපාන ගැටලු 4ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන වෙළෙඳ ගිවිසුම් 4ක් නම් කරන්න. (ලකුණු 2)

II කොටස

05. (i) (අ) කළමණාකරණය මැනවින් යොදාගත් ආයතනයක් ගතික පරිසරයට මූණදෙමින් ආයතනයක ප්‍රකාශිත අරමුණ හා පරමර්ථවඩාත් සඵලදායීව ඉටුකරගනී. එසේ නම් ආයතනයකට කළමණාකරණය අවශ්‍යවීමට හේතු 6ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීමේදී කළමනාකරුවකු විවිධ කාර්යභාරයන් සමූහයක් තුළ කටයුතු කරයි. මෙහිදී,

- ආයතනයක ප්‍රධානියා
- තොරතුරු බෙදාහරින්නා
- නායකයා
- ව්‍යවසායකයා ලෙසින් මෙම කාර්යයන් ඉටුකරන අතර ඉහත කාර්යන අයත් වන්නේ කුමන

කළමණාකරුණ භූමිකා යටතටද යන්න නම්කර ඉන් එක් කාර්යයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

(ii) (අ) සැලැස්ම තුළින් තීරණය වූ ඉලක්ක ගත අරමුණු ඉටුකරලීම සඳහා ක්‍රියාකාරී ආරම්භයක් දෙනු ලබන්නේ පියවරෙන් පියවර ක්‍රියාත්මක වන්නාවූ මනා සංවිධානකරණය මගිනි. මෙලෙස ක්‍රියාත්මක වන්නාවූ සංවිධානකරණයේ පියවර පිලිවෙළින් නම් කරන්න. (ලකුණු 2)

(ආ) විවිධ පාලන ශිල්පක්‍රම භාවිතා කිරීම මගින් ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රතිඵල මැන බැලීමත් ඒවා නිවැරදි කිරීමත් සිදුවන අතර එම ශල්ප ක්‍රම අතරින් පිරිවැය අවම කරගැනීමටත් වැරදි අවමකර ශුන්‍යමට්ටමට ගෙන ඒමටත් යොදාගන්නා ශිල්ප ක්‍රම 2 නම්කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) ප්‍රසිද්ධ ඇඟලුම් කම්හලක් වූ ''ජයලංකා'' දිගුකාලයක් විදේශයන්ට නිමි ඇඳුම් ඇපයූ ආයතනයකි. මෙහි ප්‍රගතියට හේතු වූ සාධක අතර මනා කළමණාකරණයන්, දක්ෂ අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වීමත්, මූල්‍ය, මානව හා මෙහෙයුම් කළමනාකරුවන්ගේ හා සුපරික්ෂක වරුන්ගේ යහපත් සහභාගිත්වයන් හේතු වී ඇත.
මෙම ආයතනයේ කළමණාකරුවන් එක් එක් කළමණාකරණ මට්ටම් යටතේ වර්ග කරන්න. මෙම සියලු කළමණාකරණ මට්ටම් සඳහා එක සමානව වැදගත් වූ කළමණාකරණ කුසලතාවයද කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

(iv) (අ) මෙහෙයුම් කළමණාකරණ කාර්යයට අයත් පර්යේෂණය හා සංවර්ධනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 2)

(ආ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු වැදගත්වීමට හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 2)

(v) (අ) ''නිෂ්පාදිතයක ගුණත්වය අංගෝපාංග කිහිපයක එකතුවකි.'' නම් කරන්න. (ලකුණු 2)

(ආ) නව තාක්ෂණය යොදා ගැනීමේ ගැටළු කවරේද? (ලකුණු 2)

06. (i) (අ) සමච්ඡේදන ලක්ෂ්‍යය යොදාගැනීමේ ප්‍රයෝජන කවරේද? (ලකුණු 2)

(ආ) තොග මට්ටම් ගණනය කිරීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු කවරේද? (ලකුණු 2)

(ii) අලෙවිකරණය පිළිබඳ පිළිගත් නිර්වචන දෙකක් ඉදිරිපත් කර ඒ ආශ්‍රිතව අලෙවිකරණය අර්ථ දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) 'සේවා අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් හතක් පවතී' ඒවා නම් කරන්න. (ලකුණු 2)

(ආ) භාණ්ඩ සඳහා වූ අලෙවිකරණ මිශ්‍රය ව්‍යාපාරිකයාගේ සහ ගනුදෙනුකරුගේ දෘෂ්ටියෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 2)

(iv) (අ) අලෙවිකරණ සංකල්පයේදී ඉලක්ක කෙරෙන ප්‍රධාන සාධක නම් කරන්න. (ලකුණු 2)

(ආ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේදී අවධාරණය කරන ප්‍රධානකොටස් හතර නම් කරන්න. (ලකුණු 2)

(v) ගතික ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ දත්ත කිහිපයක් පහතින් දැක්වේ.

	රුපියල්
ආරම්භක තොගය	20,000
අවසාන තොගය	30,000
ආරම්භක ණය ගැතියෝ	10,000
අවසාන ණය ගැතියෝ	30,000
මුලු විකුණුම්	300,000
ජංගම වත්කම	80,000
ජංගම නොවන වත්කම්	320,000
විකුණූ බඩුවල පිරිවැය	200,000
ණයට විකුණුම්	180,000

(අ) ඉහත තොරතුරු ඇසුරින් තොග පිරිවැටුම් අනුපාතය සහ ණයගැති පිරිවැටුම් අනුපාතය ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) මුදල් අයවැය ලේඛණය හඳුන්වන්න. (ලකුණු 2)

07. (i) (අ) මුදල් වෙළඳපොළට අයත් උප වෙළෙඳපොළවල් නම් කරන්න. (ලකුණු 2)

(ආ) ප්‍රාග්ධන වෙළෙඳ පොළට අයත් උප වෙළෙඳපොළවල් නම් කරන්න. (ලකුණු 2)

(ii) මූල්‍ය ගනුදෙනු වේගවත් කරන හා කාර්යක්ෂම කරන මූල්‍ය යටිතල පහසුකම් 4ක් නම් කරන්න.(ලකුණු 4)

(iii) (අ) රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) මානව සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 2)

(iv) (අ) අභ්‍යන්තර ආකර්ෂණයේ වාසි 04ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) තෝරාගැනීමේ ක්‍රමයක් ලෙස සම්මුඛ පරීක්ෂණ ක්‍රමයේ අවාසි 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) අනුස්ථාපනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) සේවක ඵලදායීතාව හෙවත් ශ්‍රම ඵලදායිතාව යන්න පැහැදිලි කොට එය ගනනය කරනු ලබන ආකාරය දක්වන්න. (ලකුණු 2)

08. (i) (අ) හොඳ තොරතුරුක පැවතිය යුතු ගුණාංග අටක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) විද්‍යුත් තොරතුරු පද්ධතියක් සමන්විත වන උපාංග හෙවත් එය සමන්විත වන කොටස් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) දැනුම් කාර්ය පද්ධති (knowledge works systems - KWS) හඳුන්වා එය කුමන මට්ටමේ තොරතුරු පද්ධතියක් දැයි සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) (අ) තොරතුරු තාක්ෂණය යන්න හඳුන්වන්න. (ලකුණු 2)

(ආ) සීමිත ප්‍රදේශ ජාල (LAN) හා පුලුල් ප්‍රදේශ ජාල (WAN) අතර වෙනස පැහැදිලි කරන්න.(ලකුණු 2)

(iv) (අ) ව්‍යාපාර සැලැස්මක් සකස්කළ යුතු අවස්තා 4ක් නම් කරන්න. (ලකුණු 1)

(ආ) ව්‍යාපාර සැලැස්මක අඩංගු ව්‍යාපෘති සාරාංශය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 3)

(v) (අ) මානව සම්පත් සැලැස්මක අඩංගු ප්‍රධාන කරුනු 4ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) මූල්‍ය සැලැස්මක් සකස් කිරීමේ ප්‍රයෝජන 4ක් දක්වන්න. (ලකුණු 2)

තෙවන වාර පරීක්ෂණය - 2018
13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
I පත්‍රය

(01)	- 3	(11)	- 3	(21)	- 4
(02)	- 1	(12)	- 5	(22)	- 4
(03)	- 4	(13)	- 3	(23)	- 2
(04)	- 2	(14)	- 3	(24)	- 4
(05)	- 2	(15)	- 3	(25)	- 4
(06)	- 3	(16)	- 3	(26)	- 4
(07)	- 4	(17)	- 4	(27)	- 5
(08)	- 2	(18)	- 4	(28)	- 2
(09)	- 4	(19)	- 3	(29)	- 4
(10)	- 4	(20)	- 3	(30)	- 1

31. (අ) අයිතිකරු, ගනුදෙනුකරු (ආ) විද්‍යුත් ව්‍යාපාර
32. (අ) තරඟකාරී ව්‍යාපාරවලින් තොරතුරු සොරාගැනීම, නොමග යවන සුළු ප්‍රචාරණය, රහස් තොරතුරු විකුනා මුදල් ලබාගැනීම යනාදී ආචාර ධර්ම කඩකිරීම් 2කට ලකුණු දෙන්න.
    (ආ) 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අදිකාරි පණත, 1984 අංක 6 දරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත
33. නියෝජිතයා, තිරුබදු හා තීරුබදු නොවන
34. (අ) ණය සාධ්‍යකරණය (ආ) අවතෝලනය, සමතෝලනය සහ අධිතෝලනය
35. අභ්‍යන්තර, සංඥා සළකුණු
36. (අ) වගවීම (ආ) අධිකාරිය / බලතල
37. (අ) සංකල්පනාත්මක/මනෝභාවාත්මක (ආ) තාක්ෂණික
38. (අ) තත්ත්ව කව (ආ) ආකර්ෂණය
39. (අ) නැවත ඇණවුම් ප්‍රමාණය (ආ) පොරොත්තු කාලය
40. (අ) නිෂ්පාදිත මිශ්‍රය (ආ) වටිනාකම් ත්‍රිත්වය
41. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ජාතික ප්‍රවාහන කොමිසම, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, විදුලි සන්දේශ නියාමන කොමිසම.
42. 1. කාර්මික සංවර්ධන මණ්ඩලය 2. අපනයන සංවර්ධන මණ්ඩලය
    3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 4. ජාතික සංවර්ධන බැංකුව 5. කාර්මික තාක්ෂණ ආයතනය
43. නැව්භාරපත, ආනයන සටහන්කරණය, අපනයන සටහන්කරණය, හානි රක්ෂණ සහතිකය
44. 1. භාණ්ඩ සංවර්ධන අදියර 2. හඳුන්වාදෙන අදියර 3. වර්ධන අදියර
    4. පරිණත අදියර 5. පිරිහෙන අදියර
45. 1. ලාභාංශ 2. ප්‍රාග්ධන ලාභ 3. විභජනය 4. සංචිත ප්‍රාග්ධනීකරණය 5. හිමිකම් නිකුතුව
46. 1. සමච්ඡේදන ලක්ෂ විග්‍රහය 2. මූල්‍ය විගණනය
    3. අයවැය ලේඛණ 4. ගිනුම් අනුපාත විශ්ලේෂණය
47. 1. අනාගත සේවක අවශ්‍යතා නිශ්චය කිරීම. 2. සේවක පිරිවැය අවම කිරීම.
    3. මානව සම්පත කාර්යක්ෂම හා සඵලදායිව උපයෝජනය කිරීම.
    4. උපක්‍රමික සැලසුම් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
48. - ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) - දැනුම් කාර්ය පද්ධති (KWS)
    - කාර්යාලීය ස්වයංක්‍රීය පද්ධති (OAS) - කළමනාකරණ තොරතුරු පද්ධති (MIS)
    - තීරණ උපකාරක පද්ධති (DSS) - විධායක උපකාරක පද්ධති (ESS)
49. මුදු ජාල, තාරකා ජාල, බස් ජාල, රැක් ජාල.
50. ඇස්තමේන්තුගත ජංගම වත්කම්
    ජංගම නොවන වත්කම්
    ඇස්තමේන්තුගත ජංගම නොවන වගකීම්
    ඇස්තමේන්තුගත ජංගම වගකීම්
    ඇස්තමේන්තුගත ප්‍රාග්ධනය / හිමිකම

තෙවන වාර පරීක්ෂණය - 2018

13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු

II පත්‍රය

01. (i) (අ) එකග වේ. ()

ව්‍යාපාරයක් අවදානම් දරමින් ලාභලැබීමට උත්සහකිරීම ප්‍රධාන අරමුණක් ලෙස සැලකිය හැකි වුවද ඊට අමතරව වෙනත් අරමුනු ඉටුකරගැනීම වෙනුවෙන්ද ව්‍යාපාර කටයුතු සිදුකරන බව පෙනේ. එනම් ව්‍යාපාර ක්ෂේත්‍රයේ අඛණ්ඩව රැඳීසිටීම, වෙළෙඳපොළ කොටස උපරිම කරගැනීම, සමාජ සුභසාධන කටයුතුවල යෙදීම, සේවක සුභසාධනය, ආදී අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ. එහෙයින් ව්‍යාපාරයේ එකම අරමුණ ලාභ ලැබීම නොවේ.

අරමුණු 03 ක් පැහැදිලි කිරීමට ලකුණු 1 1/2)(කරුණකට 3 ක් ඇතුළත් පිළිතුරට 3x = 1)

(ආ) නිශ්චිත බව, මැනියහැකි බව, ළඟාවිය හැකි බව, කාලය සම්බන්ධකොට තිබීම.

(කරුණු 4ට ලකුණු 1/2 බැගින් ලකුණු 2යි)

(ii) (අ) අවශ්‍යතා සෑම මිනිසාටම පොදුය. ඒවා ප්‍රවර්ධනය කළ නොහැකිය. එහෙත් වුවමනා ප්‍රවර්ධනය තුළින් වෙනස් කළ හැකිය. එම නිසා ව්‍යාපාර ප්‍රචාරණයතුළින් වුවමනාවන් ප්‍රවර්ධනය කොට තම ව්‍යාවාර සාර්ථක කරගනී. එම නිසා මිනිස් අවශ්‍යතා නොව වුවමනා කෙරේ ව්‍යාපාර අවධානය යොමු කරයි.

(පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) 1. වේගවත් බව (ඇණවුම් ලබාගැනීමට, ගෙවීම් කිරීමට, භාණ්ඩ සැපයීමට)
2. අන්තර්ජාතික වෙළෙඳපොළට පිවිසීමට අවස්ථාව ලැබීම. 3. තොග රඳවා ගැනීම් අඩුකළ හැකිවීම.
4. අතරමැදියන් අඩුවීම. 5.පිරිවැය අඩුවීම. 6.ලියකියවිලි අඩුවීම.(කරුණු 4ටලකුණු 1/2 බැගින් ලකුණු 2)

(iii)(අ) ව්‍යාපාර ආයතනයක දැක්ම (Vision) මෙහෙවර (mission), ඉලක්ක/අරමුණු (Goals/Aims) පරමාර්ථ (Objectives) ප්‍රතිපත්ති (Policies) යනාදිය ව්‍යාපාර අපේක්ෂාවන්.

(කරුණු 4ට ලකුණු 1/2 බැගින් ලකුණු 2, කරුණු 3ක් නම් ලකුණු 1 යි)

(ආ) ව්‍යාපාර කටයුතු සඳහා බලපෑම් කළහැකි සාධක වලින් සමන්විත පරිසරය ව්‍යාපාර පරිසරයයි.

- ව්‍යාපාර පරිසරය
  - අභ්‍යන්තර පරිසරය
  - බාහිර පරිසරය
    - ආසන්න පරිසරය
    - සාර්ව පරිසරය

(ලකුණු 2යි)

(iv)(අ)

අභ්‍යන්තර පරිසරය :	අයිතිකරු	→	හන්සි
	ව්‍යාපාර සම්පත්	→	ලිපිද්‍රව්‍ය, ෆොටෝ කොපි යන්ත්‍ර, භූමිය
ආසන්න පරිසරය :	ගනුදෙනුකරුවන්	→	විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්, විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලය
	තරගකරුවන්	→	ආසන්නයේ ඇති අනෙකුත් ලිපිද්‍රව්‍ය සපයන කඩ
සාර්ව පරිසරය :	දේශපාලන පරිසරය	→	රජය
	ආර්ථික පරිසරය	→	මිල මට්ටම් වෙනස්වීම්

(ආ)

ශක්තීන්	→	ප්‍රාග්ධන සම්පාදනයේ පහසුව, සම්පත් සහිත බව
දුර්වලතා	→	දැණුම සහ පළපුරුද්ද සහිත සේවකයින්ගේ හිඟ බව, අයිතිකරුගේ දැණුම හා පළපුරුද්ද අඩුවීම.
අවස්ථා	→	ගණුදෙනුකරුවන්ට පහසුවෙන් ළඟාවිය හැකි බව රජයෙන් කුඩා ව්‍යාපාර වලට සපයන සහන.
තර්ජන	→	තරගකරුවන්ගෙන් එල්ලවනදැඩි තරගය නියමිත වේලාවට අවශ්‍ය ද්‍රව්‍ය නොලැබී යාම.

(ලකුණු 2)

(v) (අ)

ගණුදෙනුකරුවන්ට	→	නියමිති පරිදි වංචා වලින් තොරව ගනුදෙනුකරුවන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, ඔවුන්ට අවශ්‍ය ප්‍රතිලාභ ප්‍රමාණවත්ව ගෙවීම.
සේවකයින්	→	නියමිත කාලයේදී රැකියාවේ ස්ථිර කිරීම, වැඩ කිරීමට සුදුසු පරිසරයක්නිර්මාණය කිරීම.
අයිතිකරුවන්	→	ප්‍රාග්ධනයට ප්‍රමාණවත් ප්‍රතිලාභ ලබාදීම. කාර්යක්ෂමව කළමනාකරණ කටයුතු පවත්වාගෙන යාම.
සමාජය	→	පරිසරයට හිතකරව ව්‍යාපාර කටයුතුපවත්වාගෙන යාම පරිසර දූෂණයට එරෙහිව වැඩසටහන් සමාජය තුළ සිදු කිරීම. (ලකුණු 4යි.)

02. (i) (අ) ගුණාත්මක ණය පාලනය :තෝරාගත් ක්ෂේත්‍ර සඳහා ලබාදෙන ණය සඳහා සීමා පැනවීම.
ප්‍රමාණාත්මක : දෙනු ලබනණය ප්‍රමාණය අඩු වැඩි කිරීම. (ලකුණු 2යි)

(ආ) ගුණාත්මක ණය සීමා පැනවීමනිසා අවශ්‍ය ක්ෂේත්‍ර වලට ණයමුදල් ගලායාම නිසා එම ව්‍යාපාර සංවර්ධනය ඇතිවේ. අධෛර්යමත් කලයුතු අංශ වලට ණය දීමේදී කොන්දේසි පනවන නිසා එම අංශවලට ණය මුදල් ගලා යාම අඩු වීම නිසා ව්‍යාපාර වලපසුබෑමක් සිදුවේ. (ලකුණු 2)

(ii) 1. විචාරාත්මක අවබෝධය 2. ක්‍රියාකාරී සහභාගීත්වය 3. සමාජය ගැන සැලකිලිමත්වීම.
4. පරිසර දැණුවත්භාවය 5. සහයෝගිතාවය (ලකුණු 4යි)

(iii)(අ) ව්‍යාපාර හිමිකාරිත්වය, ව්‍යාපාරවල ස්වභාවය, ව්‍යාපාර අරමුණ යොදවා ඇති ප්‍රාග්ධනයේ ප්‍රමාණය. (ලකුණු 2)

(ආ) අවශ්‍ය ප්‍රාග්ධනයේ ප්‍රමාණය, රජයෙන් ලබාදෙන සානුබලව්‍යාපාරයේ පැවැත්ම කෙටිකාලීනද දිගුකාලීනද යන බව අයිතිකරුවන්ගේ සංඛ්‍යාව. (ලකුණු 2යි)

(iv)(අ) කොටස් නිකුත්කිරීමක්, සිදු නොකරන සාමාජිකයින්ගේ වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති ඇප වටිනාකමකට සීමාවන සමාගම් වේ. (ලකුණු 2යි)

(අ) සිය අවශ්‍යතා හා වුවමනාවන් ඉටුකරගැනීමට ස්වේච්ඡාවෙන් එක්සත් වූ පුද්ගලයින්ගේ සවාධීන සංගමයකි. (නිවැරදි නිර්වචනයකට ලකුණු 2 දෙන්න)

(v) (අ) සීමිත වගකීම, ලියාපදිංචිය අනිවාර්ය වීම, 2007 අංක 07 දරණ සමාගම් පනතේ බලපෑම, නීතිමය පුද්ගලභාවයක් පැවතීම, ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වීම. (ලකුණු 2)

(ආ) 1. ව්‍යවසායකත්වය නිසා නව්‍යතා බිහිවීමෙන් ජාතික නිස්පාදිතය ඉහළයාම.
2. නව රැකියා අවස්ථා බිහිවීමෙන් ආර්ථික සංවර්ධනයට දායක වීම.
3. වෙළෙඳපොළ කටයුතුපුළුල් වීමත්, නව තරගකාරී වෙළෙඳපලවල් බිහිවීමත් ආර්ථික සංවර්ධනයකට හේතු වීම.
4. ප්‍රාදේශීය සම්පත් භාවිතයට ගැනීමෙන්, ඒවාට ඉහළ ඉල්ලුමක් ඇතිවීම.
5. නවව්‍යාපාර බිහිවීම ආර්ථික සංවර්ධනයට ඉවහල් වේ. (කරුණු 4ට ලකුණු 2)

03. (i) (අ) * තමා පිළිබඳ හොඳ අවබෝධයක් තිබීම. * ව්‍යාපාර අවස්ථා තිබීම.
* ලඟාකර ගත හැකි අදහසක් තිබීම. * අවශ්‍ය සම්පත් තිබීම. * මනා කළමනාකරණයක් තිබීම.
(කරුණු 4කට ලකුණු 2යි)

(ආ) 1. ආත්ම විශ්වාසය 2. කැපවීම 3. අවබෝධය 4. ඉක්මන් තීරණ ගැනීම 5. නම්‍යශීලී බව
6. අභිප්‍රේරණය වී සිටීම 7. අවදානම් කළමණාකරණය කළහැකි වීම. 8. නිර්මාණශීලී බව
9. සුභවාදී බව. 10. ස්වාධීන බව 11. නිවැරදි දැක්ම 12. අරමුනු මුදුන් පමුණුවා ගැනීමේ වුවමනාව.
(කරුණු 8 ට ලකුණු 2)

(ii) (අ) * වෙළෙඳපොලේ ස්වභාවය * නිෂ්පාදිතයේ ස්වභාවය
* අවශ්‍ය ප්‍රාග්ධනය හා එය සපයා ගන්නා ආකාරය * තරගය * සංවිධාන ක්‍රමය * බලපාන නීතිරීති.
(කරුණු 4ට ලකුණු 2)

(ආ)

ව්‍යවහාර මුදල්	**බැංකු මුදල්**
1. 100% ද්‍රවශීලයි.	1. ද්‍රවශීලතාවය සාපේක්ෂව අඩුයි.
2. මහ බැංකුව නිකුත් කරයි.	2. වානිජ බැංකු නිකුත් කරයි.
3. මේ මුදල් වලින් සෘජුවම ගෙවීම් කළ හැකිය.	3. චෙක්පත් උපයෝගී කරගෙන ගෙවීම් කළ යුතුය
4. පොදු පිළිගැනීමක් ඇත.	4. දෙපාර්ශවයේ විශ්වාසය මත පිළිගැනේ.

(වෙනස්කම් 4ට ලකුණු 2යි)

(iii) **1. ද්‍රව්‍ය භාවිතය :** භාණ්ඩ හුවමාරු ක්‍රමයේ පැවති විවිධ දුර්වලතා නිසා හුවමාරුව පහසු කිරීමසඳහා විවිධ ද්‍රව්‍ය භාවිතය.
2. ලෝහ වර්ග භාවිතය : රන්, රිදී, වැනි ලෝහ වර්ග භාවිතා කිරීම.
3. ලෝහ කාසි මුදල් භාවිතය : විවිධ ප්‍රමාණ වලින් යුත් ලෝහ කැබලිවලමුහුණත බර, පිරිසුද බව සහඅගය යනාදිය සඳහන් කරමින් ලෝහ කාසි මුදල් භාවිතයයි.
4. කාසි හා නෝට්ටු මුදල් භාවිතය : වටිනා ලෝහ මුදල් වශයෙන් භාවිතයට ගැනීමේ අපහසුතාවය පිළියමක් වශයෙන් නෝට්ටු මුදල් භාවිතයට ගන්නා ලදී.
5. බැංකු මුදල් භාවිතය : බැංකු ජංගම ගිණුම් ආශ්‍රිතව නිකුත් කරනු ලබන චෙක්පත් වේ.
6. විද්‍යුත් මුදල් භාවිතය : තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේදියුණුවත් සමග හඳුන්වා දුන් කාඩ්පත් විශේෂයයි. (කරුණු 6ට ලකුණු 4යි)

(iv) (අ) වාසි :
*ගනුදෙනුව ගිණුම මගින් පියවීම. * වට්ටම් ලැබීම * ගනුදෙනු පිළිබඳ වාර්තාවක් තිබීම. * චෙක්පත් භාර ගැනීමට සමහර වෙළෙඳුන් මැලිකමක් දැක්වූවද හරපත් වලට පිළිගැනීම වැඩිවීම. * හරපත්භාවිතා කර ATM මගින් ගිණුමේ මුදල් ආපසුලබාගත හැකිවීම. * මුදල් එහා මෙහා ගෙන යාමේ අවදානම අඩුවීම. (කරුණු 4ට ලකුණු 2යි)

(ආ) 1. විවිධ තැන්පත් පවත්වාගෙන යාම : ජංගම ගිණුම්, සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිනුම්, කාලීන හා ස්ථාවර තැන්පතු ගිණුම්.
2. ණය පහසුකම් සැපයීම : බැංකු ණය හා අයිරා ණය ලබාදීම.
3. විදේශ විනිමය මිලට ගැනීම හා විකිණීම : විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු
4. නියෝජිත සේවා : ගනුදෙනුකරු වෙනුවෙන් විවිධ ආයතනවලට ගෙවීම් භාර ගැනීම හා පියවීම.
5. කල්බදු සේවා : වටිනාකමින් වැඩි වත්කම් මිලට ගැනීමේදී කල්බදු පහසුකම් සැපයීම.
6. ණයවරලිපි සේවා : ජාත්‍යන්තරගනුදෙනු වලදී ගෙවීම් කිරීමේක්‍රමයක් ලෙස නිකුත් කරයි.
7. මුදල් ශ්‍රේෂණ කටයුතු : ගනුදෙනුකරු වෙනුවෙන් ලැබීමට ඇති මුදල්ලබාගැනීම හා අදාළ ආයතනයන්ට ගෙවීම් කිරීම.
8. ණයපත්හා හරපත්ක්‍රියාත්මක කිරීම : නිශ්චිතකාලයන් දක්වා පොළී රහිත නිශ්චිත මුදල් ප්‍රමාණයක් දක්වා භාන්ඩ හා සේවා මිලට ගැනීමට ණයපත් නිකුත් කරයි. ගිණුමෙන් මුදල් අඩුවන පරිදි හරපත් නිකුත් කරයි.
9. ටෙලි බැන්කින් : දුරකථන මගින් බැංකු කටයුතු
10. අන්තර්ජාල බැංකුකරණය : අන්තර්ජාලය හරහා බැංකු කටයුතු. (කරුණු 4ට ලකුණු 2)

(v) (අ) කිසියම් හානියක් අනතුරක් වීමට ඇති ඉඩකඩ හෙවත්හානියක් වීමට ඇති සම්භාවිතාවයයි. මෙය මුල්‍යමයවශයෙන් ගණනය කළහැකි විය යුතුයි.
(ඉහත විස්තර අඩංගු පිළිතුරට සම්පූර්ණ ලකුණු 2 ද එසේ නොමැති නම් අදාළත්වය සලකා ලකුණු 1ක් දෙන්න)

(ආ) ගිනි උවදුරු නිසා ව්‍යාපාර අඩපනවීම වැළැක්වීම ආනුශංගික අලාභ රක්ෂණ ඔප්පු මගින් සිදුවේ. ගින්න හා වෙනත් උපද්‍රව නිසා දේපළවලට හානි සිදුවීමේදී එම හානියට අමරතරව එම උපද්‍රව හේතුකොටගෙන ව්‍යාපාර කටයුතු අඩපන වීම නිසා නොලැබීයන ලාභ සඳහා රක්ෂණාවරණයක් ලබාගැනීමට හැකියාව ඇත. එය රක්ෂිතයාට ලබාගත නොහැකි වූ ලාභය හෙවත් මුල්‍යමය වාසිය පූර්ණ කිරීමයි.
(ඉහත කරුණු ඇතුළත් සම්පූර්ණ පිළිතුරට ලකුණු 2, එසේ නොමැතිනම් අදාළ පරිදි ලකුණු දෙන්න.)

04. (i) (අ) 1. ඇගයූ ඔප්පුව : එකම ද්‍රව්‍ය තොගයක් යම් කාල සීමාවක් තුළ කොටස් වශයෙන් ආනයන හා අපනයන කරන්නෙකුට මුළු තොගයේ වටිනාකම එකවර ලබාගත හැකි රක්ෂණාවරණය ඇගයූ ඔප්පුවයි. කොටස් වශයෙන් ප්‍රවාහනය කිරීම ඇරඹුමත් සමඟ එම කොටසේ අගය රක්ෂකට දැන්විය යුතුවේ. ඒ අනුව මාර්ගස්ථ තොගයේ අගය මුලදී ගිවිසගත් මුලු තොගයේ අගයෙන් අඩුකරයි.
(ඉහත කරුණු අදාළ පිළිතුරට ලකුණු 1, එසේ නොමැතිනම් අදාළත්වයට ලකුණු දෙන්න)

2. අනාගතාවරණ ඔප්පුව : ඔප්පුවට අනුව අදාළකාල සීමාව තුළ නැව්ගත විය හැකි භාණ්ඩවල වටිනාකම කිසියම් උපරිමයකට අගය කරගනී නැව් බඩු නෞගත වීම සිදුවන අයුරින් ඒ ඒ අවස්ථාවන්හිදී ප්‍රකාශන ඉදිරිපත් කිරීම මත ගිවිසගත් උපරිම රක්ෂිත මුදල හීන වී යාම මෙහි ඇති විශේෂත්වයයි.
(ඉහත කරුණු අදාළ පිළිතුරට ලකුණු 1, එසේ නොමැතිනම් අදාළත්වයට ලකුණු දෙන්න)

(ආ) ප්‍රවාහනයේ කාර්යක්ෂමතාවයට එක් අංගයක් පමණක් සංවර්ධනය වීම ප්‍රමාණවත් නොවේ. ප්‍රවාහනය කාර්යක්ෂම වීමට නම් මුලු ප්‍රවාහන පද්ධතියම එනම් මාධ්‍ය, බලය, පර්යන්තය යන අනිකුත් අංගද සංවර්ධනය විය යුතුවේ. ඒ තුළින් ප්‍රවාහනයේ කාර්යෂමතාවය නංවාලිය හැක.
(මෙම අදහස දෙන පිළිතුරට ලකුණු 2, එසේ නොමැතිනම් අදාළත්වයට ලකුණු දෙන්න)

(ii) (අ) ප්‍රවාහනය ව්‍යාපරිකයන්ට අත්‍යවශ්‍ය ව්‍යාපාරික සේවාවකි. වෙළඳ ද්‍රව්‍ය කලට වේලාවට වෙළඳපල කරා ගෙන ඒම. පාරිභෝගිකයන් වෙත බෙදා හැරීම හා වෙළඳපොළ පුලුල්කර ගැනීම, තරගයට මූණදීම ආදී කටයුතු සඳහා ප්‍රවාහනය විශාල මෙහෙයක් ඉටුකලද සමාජයට විශාලපිරිවැයක් දැරීමට සිදුවේ. මාර්ග නඩත්තු පිරිවැය, පරිසර දූෂණය, මාර්ග අනතුරු ආදිය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවේ.
(ඉහත කරුණු අදාල ප්‍රමාණවත් පිළිතුරට ලකුණු 2ක් දෙන්න.)

(ආ) 1.ව්‍යාපාරයට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හැකිවීම.
2. තොරතුරු ප්‍රසිද්ධ කිරීමට උපකාරී වීම.
3. භාණ්ඩ හා සේවා පිළිබඳ ලොව පුරා ප්‍රචාරණය කළහැකිවීම.
4. යම් යම් දේ මිලදීගැනීමට හෙවත් විද්‍යුත්වානිජ කටයුතු වලදී යොදාගත හැකිවීම.
5. සමජාතීය භාණ්ඩ හා තරගකරුවන් පිළිබඳ තොරතුරු ක්ෂණිකව ලබාගතහැකිවීම.
6.
(කරුණු 6ක් සඳහන්වී ඇති පිළිතුරට ලකුනු 2, කරුණු 3කට ලකුණු 1 බැගින් දෙන්න)

(iii)(අ) වෙළෙඳ අතරමැදියන්, නියෝජන අතරමැදියන් (ලකුණු 2)

(ආ) විදේශ රටවලින් ගෙන්වන බාණ්ඩ රටතුළට ගෙන වෙනස්කිරීම් කර හෝ නොකර නැවත අපනයනය ප්‍රතිඅපනයනයයි.
විදේශ රටවලින් ගෙන්වන භාණ්ඩ රටතුළට නොගෙන වරායේ තබා නැවත අපනයනය.(ලකුණු 2)

(iv)

දේශීය	විදේශීය
1. රට අභ්‍යන්තරයේ සිදුවේ.	1. රටින් බැහැරව සිදුවේ
2. දේශීය මුදල් භාවිතා කරයි.	2. විවිධ දේශීය හා විදේශීය මුදල් යොදාගනී.
3. විදේශ විනිමය ප්‍රතිපත්ති අදාළ නොවේ.	3. විදේශ විනිමය ප්‍රතිපත්ති අදාළ වේ.
4. තීරුබදු අය නොකරයි.	4. තීරු බදු අයකරයි.
5. අන්තර්ජාතික සහයෝගය වර්ධනය නොවේ.	5. අන්තර්ජාතික සහයෝගය වර්ධනය වේ. (ලකුණු 4යි)

(v) (අ) * අරමුදල් හිඟය, * මහාපරිමාණ සිල්ලර වෙළෙන්දන්ගෙන් එල්ලවන තරගය. * බොල් ණය ඇතිවීම.
* වෙළෙඳ කටයුතු කළමනාකරණය කිරීමේ දුෂ්කරතාවය. (ලකුණු 2)

(ආ) උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම NAFTA
දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම SAFTA
ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම APTA
ඉන්දුලංකා වෙළෙඳ ගිවිසුම IFTA (ලකුණු 2යි)

05. (i) (අ) 1. ආයතනයේ අරමුණු පරමාර්ථ සාර්ථකව ලඟාකර ගැනීම.
2. සීමිත සම්පත් කාර්යක්ෂමව හා සඵලදායීව යොදාගැනීමට.
3. ගතික වූ පරිසරයට සාර්ථකව මූණ දීමට.
4. ආයතනයේ ඇල්ම ඇති පාර්ශයවන්ගේ අපේක්ෂා උපරිම ලෙස ඉටුකර දීමට.
5. ව්‍යාපාර සමාජ වගකීම් ඉටුවන අයුරින් කටයුතු කිරීමට.
6. ගැටළුවලට සාර්ථකව මූණදීමට.
7. තරඟයට සාර්ථකව මූණදීම තුළින් දිගුකාලීන පැවැත්ම තහවුරු කරගැනීමට.
8. ආයතනයකට මූණදීමට සිදුවන සංකීර්ණතාවයන් මඟහරවා ගැනීමට

(පිළිතුරු 6ක් දක්වාඇතිනම් ලකුණු 2යි, කරුණු 4-5දක්වා 1 1/2 , 4ක් නම් යි 4ට අඩුනම් ලකුණු නැත.)

(ආ) * ප්‍රධානියා/නායකයා : අන්තර් පුද්ගල භූමිකාව
* තොරතුරු බෙදාහරින්නා - තොරතුරු භූමිකාව
* ව්‍යවසායකයා : තීරණ භූමිකාව

ප්‍රධානියා : ආයතනයක ගිවිසුම් අත්සන් කිරීම ආදී නීතිමය කටයුතු වලදීත්, ව්‍යාපාර ආයතනයේ විශේෂ අවස්ථාවලදීත් කොටස් හිමියන්ගේ රැස්වීම් ඇමතීම් ආදී සමාජීය කාර්යන් වලදීද ආයතනයේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම.

නායකයා : ව්‍යාපාරයේ අරමුණු ඉටුකරගැනීමේදී තමා යටතේ සිටින නිලධාරීන් හා සේවකයන් අභිප්‍රේරණය කරමින් දිරිමත් කිරීමේ කටයුතුත්, සේවකයන් උසස්කිරීම, ඉවත්කිරීම හා බඳවාගැනිමේ කටයුතු ආදියත් සිදුකරයි.

තොරතුරු බෙදාහරින්නා : ආයතනය පිළිබඳ නිවැරදි තීරණ ගැනීමට සමාන මට්ටමේ හා ඉහල කළමනාකරුවන්ටත් යටත් නිලධාරීන්ටත් ලිඛිත වාර්තා, දුරකථන ඇමතුම් හා රැස්වීම් ආදිය මගින් තොරතුරු සැපයීම.

ව්‍යවසායකයා : ගතික පරිසරයන්ට ගැළපෙන අයුරින් නව වෙනස්කම් කිරීම ක්‍රියාවලි හඳුන්වාදීම් හා සංවිධානයේ විවිධ වෙනස්කම් කිරිම මගින් නවීකරණයන් සිදුකිරීම මොහු මගින් සිදුවේ. (භූමිකා නිවැරදිව නම්කිරීමට ලකුණු 1යි. එකක් විස්තර කිරීමට ලකුණු 1යි)

(ii) (අ) 1. කාර්යහඳුනාගැනීම. 2. වැඩබෙදීම. 3. දෙපාර්තමේන්තුකරණය 4. අදිකාරය හා වගකීම් පැවරීම
5. වැඩ කිරීමේ ප්‍රමිති ඇතිකිරීම. 6. සම්පත් බෙදීම. 7. සමායෝජනය
(පිළිවෙලින් පියවර නම් කිරිමට ලකුණු 2යි)

(ආ) 1.ඉදිරි පෝෂණපාලනය 2. සහගාමි/ක්‍රියාවලි පාලනය

ඉදිරි පෝෂණ පාලනය : ආයතනයක් ඉදිරියේ ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල ඇතිවීමත් එම ආයතනයේ කාර්ය සාධනයට ඇතිවිය හැකි හානි වළක්වා ගැනීම පිණිස කරනු ලබන පාලනයයි. උදා : සේවකයින් පුහුණු කිරීම, යන්ත්‍ර නිවැරදිව නඩත්තුව ආදිය සිදුවේ. (මෙමගින් පිරිවැය අවම වේ)

සහගාමී පාලනය : ආයතනයක වැඩකටයුතු සිදුවනඅතරතුර විචල්‍යයන් වළක්වා ගැනීමට සිදුවන පාලනයයි. උදා : නිෂ්පාදන ක්‍රියාවලියේදී සිදුවනතත්ව පාලනය ආදිය.
(නම් කිරීමට ලකුණු 1යි. එකක් විස්තර කිරීමට ලකුණු 1යි)

(iii)කළමනාකරණ මට්ටම් :

අධ්‍යක්ෂ මණ්ඩලය	-	අග්‍ර කළමණාකරණ මට්ටම්
මානව සම්පත් කළමණාකරු මූල්‍ය කළමණාකරු මෙහෙයුම්කළමනාකරු	-	මධ්‍ය මට්ටම
සුපරික්ෂකවරු, කාර්යාල කළමනාකරුවන්	-	පළමුපෙළ

* මෙ සියලු කළමනාකරුවන්ට එකසේ වැදගත් වන කළමනාකරණ කු-සලතාවය නම් මානව කුසලතායි. සියලු කළමණාකරුවන් තම අරමුනු ඉටුකරගැනීමට කටයුතු කිරීමට සිදුවන්නේ සේවකයන් සමගයි. ඒඅනුව සේවකයින්ගේ අපේක්ෂාවන් ඉටුකිරීම මගින් ආයතනයේ අරමුණු ඉටුකරලීමට සියළු කළමණාකරුවන් කටයුතු කරයි. එමෙන්ම භෞතික සම්පත් වලින් නිසිප්‍රයෝජන ගැනීමට මානව කුසලතා සියළු කළමණාකරණ මට්ටම් ඇතිකර ගත යුතුය. අන් අය සමඟ වැඩ කිරීමේදී ඔවුන් අවබෝධ කරගැනීමට ඔවුන්ට මානුෂියව සලකමින් ඔවුන් ලවා වැඩ ගැනීමට සියළු කළමනාකරණ මට්ටම් කටයුතු කරමින් ආයතනයේ අරමුණු ඉටුකරගනී.

(කළමණාකරණ මට්ටම් නම් කිරීමට ලකුණු 1යි, විස්තර කිරීමට ලකුණු 3යි. අදාළප්‍රමාණවත් විස්තර කිරීම් සඳහා යෝග්‍ය පරිදි ලකුණු ප්‍රදානය කරන්න.)

(iv)(අ) පවත්නා නිෂ්පාදිතය පිළිබඳවත්, නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳවත් නව නිෂ්පාදන සැලසුම් පිළිබඳවත් තොරතුරු ඒකරාශී කිරීම හා ඒවා වැඩි දියුනු කිරීම පර්යේෂණය හා සංවර්ධනය ලෙස හඳුන්වයි.(ල. 2)

(ආ) 1. නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ නංවාගත හැකිවීම.
2. නිෂ්පාදන පිරිවැය අඩුකරගත හැකිවීම.
3. නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්‍ෂමතාව වැඩිවීම.
4. අපතය/නාස්තිය අවම කරගත හැකිවීම.
5. වඩාත් හොඳින් පාරිභෝගිකයා තෘප්තිමත් කළහැකිවීම.
6. නම්‍යතා හඳුන්වා දිය හැකිවීම. (කරුණු 4ට ලකුණු 2)

(v) (අ) * මනා ක්‍රියාකාරිත්වය * විශ්වාසවන්තභාවය * උචිත බව * කල්පැවැත්ම
* ප්‍රමිතියට අනුකූලවීම * ආරක්ෂිත බව (කරුණු 4ට ලකුණු 2)

(ආ) * විශාල ආයෝජනයක් අවශ්‍ය වීම. * තාක්ෂණය සීඝ්‍රයෙන් වෙනස්වීම.
* සේවක සම්බන්ධතා දුර්වලවීම. * හදිසි තාක්ෂණික බිඳවැටීම් හා දෝෂ ඇතිවීම.
* පරිසර ගැටළු මතුවීම. * පුහුනු ශ්‍රමිකයින්ගේ හිඟය. (ලකුණු 4ට ලකුණු 2)

06. (i) (අ) 1. නිෂ්පාදන සැලසුම්කරණයට ප්‍රයෝජනවත් වීම.
2. නිෂ්පාදිතයක මිල නියම කිරීම සඳහා ප්‍රයෝජනවත්වීම.
3. ව්‍යාපාර ආදායම, පිරිවැය සහ මිල යන අංශවල ඇතිවන වෙනස්වීම විග්‍රහකළ හැකිවීම.
4. නිමවුමේ හෝ අලෙවියේ විවිධ මට්ටම්වලදී ලාභය හෝ අලාභය පෙන්නුම්කළහැකිවීම.
5. ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම සඳහා පිරිවැය, ලාභය හා පරිමාව පාලනය කිරීමේ උපකරණයක් ලෙස භාවිතා කළ හැකිවීම. (කරුණු 4කට ලකුණු 2)

(ආ) 1. කාලපරිච්ඡේදයට අදාළ ද්‍රව්‍ය පරිභෝජනය 2. යලි ඇණවුම් කාලය
3. යළි ඇණවුම් ප්‍රමාණය (කරුණු 2ට ලකුණු 2)

(ii) ''පුද්ගලයින්ගේ හා කණ්ඩායම්වල අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වටිනාකම් ඇති භාණ්ඩ හා සේවා වෙනත් අය ලවා නිර්මාණය කිරීම, ඉදිරිපත් කිරීම සහ නිදහසේ හුවමාරු කිරීම සඳහා වූ සමාජයීය ක්‍රියාවලිය අලෙවිකරණයයි.''

Philip Kotler

''පුද්ගල හා සංවිධානමය අරමුණු තෘප්තිමත් කිරීම සඳහා හුවමාරු කිරීමට අවශ්‍ය අදහස්, භාණ්ඩ හා සේවා, සංකල්පනය, මිල කිරීම ප්‍රවර්ධනය කිරීම හා බෙදා හැරීම සැලසුම්කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අලෙවිකරණයයි.'' American Marketing Association

ඉහත සඳහන් අලෙවිකරණය සම්බන්ධ ප්‍රසිද්ධ නිර්වචනයන්ට අනුව අලෙවිකරණය යනු පුද්ගලයින්ගේ හා ආයතනවල අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා යොමු වූ සමාජයීය හා කළමණාකරණ ක්‍රියාවලියයි. (ලකුණු 4යි)

(iii)(ආ) * නිෂ්පාදිතය * මිල * ස්ථානය (බෙදාහැරීම) * ප්‍රවර්ධනය * මිනිසුන් * ක්‍රියාවලිය
* භෞතික වටපිටාව. (ලකුණු 2යි)

(ආ) **ව්‍යාපාරික දෘෂ්ටියෙන් ගනුදෙනුකරු දෘෂ්ටියෙන්**

ව්‍යාපාරික දෘෂ්ටියෙන්	ගනුදෙනුකරු දෘෂ්ටියෙන්
1. නිෂ්පාදිතය	1. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා
2. මිල	2. පිරිවැය
3. ස්ථානය	3. පහසුව
4. ප්‍රවර්ධනය	4. සන්නිවේදනය

(ලකුණු 2)

(iv)(අ) 1. ඉලක්ක වෙළෙඳපොළ 2. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා
3. සමෝධානික අලෙවිකරණ උපායමාර්ග 4. පාරිභෝගික තෘප්තිය තුළින් ලාභය (ලකුණු 2)

(ආ) 1. අභ්‍යන්තර අලෙවිකරණය 2. සමෝධානික අලෙවිකරණය
3. සම්බන්ධතා අලෙවිකරණය 4. සමාජ වගකීම් අලෙවිකරණය (ලකුණු 2)

(v) (අ) තොග පිරිවැටුම් අනුපාතය = විකුණූ බඩුවල පිරිවැය / සාමාන්‍ය තොගය

= රු. 200000 / රු. 25000

= වාර 08 (ලකුණු 1)

ණයගැති පිරිවැටුම් අනුපාතය = ණය විකුණුම් / සාමාන්‍ය ණය ගැතියෝ

= රු. 180,000 / රු. 20,000

= වාර 09 (ලකුණු 2)

(ආ) අපේක්ෂිත අනාගත කාපරිච්ඡේදයක මුදල්ලැබීම් සහ මුදල් ගෙවීම් සැලකිල්ලට ගෙන සැලුස්මකරණයේදී හා තිරණ ගැනීමේදී භාවිතයට ගැනීම සඳහා අභ්‍යන්තර මූල්‍ය ඇස්තමේන්තුවක් ලෙස පිළියෙළ කරනුලබන්නක් ලෙස මුදල් අයවැය ලේඛණය හැඳින්විය හැකිය. (ලකුණු 2)

07. (i) (අ) 1. භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ 2. අන්තර්බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළ
3. අභ්‍යන්තර විදේශ විනිමය වෙළඳපොළ 4. වාණිජ පත්‍රිකා වෙළඳපොළ (ලකුණු 2)

(ආ) 1. කොටස් වෙළඳ පොළ 2. ණයකර වෙළඳපොළ 3. භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ(ලකුණු 2)

(ii) 1. SSSS 2. RTGS 3. SWIFT 4. LANKA settle
5. LANKA Secure 6. CDS 7. SLIPS (ලකුණු 4)

(iii)(අ) නීසියම් රැකියාවකට අයත් කාර්යයන්, යුතුකම් වගකීම්, සේවා කොන්දේසි ආදිය විස්තරකෙරෙන ප්‍රකාශය රැකියා විස්තරය වේ.

රැකියාවක් ඉටුකිරීමට එයදරන්නා සතුවිය යුතු සුදුසුකම් ඇතුළත්කර සකස්කර ලියවිල්ල රැකියා පිරිවිතර වේ. (පැහැදිලි කිරීමට හෝ වෙනස්කම් දැක්වීමට ලකුණු 2)

(ආ) * අනාගත මානවසම්පත් අවශ්‍යතාව (ඉල්ලුම) පුරෝකථනය.
* මානව සම්පත් සැපයුම තක්සේරු කිරීම.
* මානව සම්පත් ඉල්ලුම හා සැපයුම සන්සන්දනය කිරීම.
* මානව සම්පත් සපයා ගැනීමට ගතයුතු උපාය මාර්ග සංවර්ධනය කිරීම.
* මානව සම්පත් සැලසුම්කරණ ප්‍රයත්නය ඇගයීම. (පියවර පිළිවෙළින් දැන්වීමට ලකුණු 2)

(iv)(අ) * සේවකයින් අභිප්‍රේරණය වීම. * මනා ශ්‍රමික සබඳතා ඇතිවීම.
* යෝග්‍යතාව සේවකයින් රඳවා ගැනීමේ පහසුව.
* ආකර්ෂණය හා බඳවා ගැනීමේපිරිවැය අඩුවීම.
* සේවකයින්ගේ කැපවීම හා ලැදියාව ඉහළයාම. (කරුණු 4කට ලකුණු 2)

(ආ) * අපේක්ෂකයා සපයන පිළිතුරු පරික්ෂකයාට හිතාමතාම විකෘති කළහැකි වීම.
* ඇතැම් රැකියා සඳහා යෝග්‍ය නොවීම.
* අපේක්ෂකයා තුළ අනියත බියක් ඇතිවීම.
* සම්මුඛ පරික්ෂකවරු අතින් සිදුවිය හැකි ඌණතා (පක්ෂග්‍රාහීවීම)
* පිරිවැය අධිකවීම හා කාලය වැයවීම ඉහළයාම.
* අපේක්ෂකයා ව්‍යාජ ලෙස හැසිරීමට උත්සාහ දැරීම. (කරුණු 4ට ලකුණු 2)

(v) (අ) අලුතින් බඳවාගත් සේවකයෙකු ප්‍රථමයෙන්ම සංවිධානයට හඳුන්වාදීම සහ ඔහුට සිය රැකියාව, වැඩ කණ්ඩායම, වැඩ පරිසරය සහ සමස්ථ සංවිධානය පිළිබඳව අවබෝධයක් ලබාදීමේ ක්‍රියාවලිය අනුස්ථාපනයයි. (පැහැදිලි කිරීමට ලකුණු 2යි)

(ආ) සේවක යෙදවුම් හා නිමැවුම් අතර පවතින සම්බන්ධතාව ශ්‍රම ඵලදායීතාව වේ. මෙහිදී අඩු සේවක ප්‍රමාණයකින් ඉහළ නිමැවුමක් ලබාගැනීමට අපේක්ෂා කරයි. (පැහැදිලි කිරීමට ලකුණු 1යි)

ශ්‍රම ඵලදායීතාවය = $\frac{\text{නිමැවුම}}{\text{සේවක සංඛ්‍යාව}}$ (සූත්‍රය දැක්වීමට ලකුණු 1)

08. (i) (අ) * අදාළ බව * නිවැරදි බව * පූර්ණ බව * විශ්වාසදායක බව
* සවිස්තරාත්මක බව * කලට වේලාවට ලබාගත හැකි වීම. * අඩු පිරිවැය
* විවිධ මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කළහැකි වීම. * ආරක්ෂාකාරී බව
* යාවත්කාලීන බව * අවබෝධකරගත හැකිවීම. * නම්‍යශීලීවීම.
(කරුණු 8 ලකුණු 2යි, කරුනු 6කට ලකුණු 1යි)

(ආ)

දෘඩාංග	Hardware
මෘදුකාංග	Software
ජීවාංග	Liveware
දත්ත	Data
ක්‍රියාපටිපාටි	Procedures

(කොටස් 5කට ලකුණු 2යි, කොටස් 4කට ලකුණු 1යි)

(ii) ආයතනයක කටයුතුකරන දැනුම් සේවකයින් හෙවත් ඉංජිනේරුවන්, පර්යේෂකයින්, නීතීඥයින් වැනි වෘත්තිකයින්ගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය කරන තොරතුරු සපයනු ලබන තොරතුරු පද්ධති දැනුම්කාර්ය පද්ධති වේ. (පැහැදිලි කිරීමට ලකුණු 3යි)
දැනුම් මට්ටමේ තොරතුරු පද්ධතියකි. (මට්ටම සඳහන් කිරීමට ලකුණු 1)

(iii)(අ) පරිගණක හා සන්නිවේදන තාක්ෂණයන් ඔස්සේ වාචික, රූපමය, අක්ෂරමය හා අංශමය තොරතුරු එක්රැස් කිරීම, සැකසීම, ගබඩාකිරීම හා බෙදාහැරීම ඇතුළත් ක්‍රියාවලිය තොරතුරු තාක්ෂණයයි. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ) එක් ගොඩනැගිල්ලක හෝ එක් වැඩබිමක පිහිටා ඇති පරිගණක හා පරිගණක ජාල සම්බන්ධ කොට ගොඩනැගූ පරිගණක ජාලයක් සීමිත ප්‍රදේශ ජාලයක් (LAN) ලෙස හඳුන්වනු ලබයි.

නගර කිහිපයක් හෝ රටවල් කිහිපයක් අතර ඇති පරිගණක හා ජාල සම්බන්ධකර ගොඩනැගූ පරිගණක ජාල පුළුල් ප්‍රදේශ ජාල (WAN) වේ. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(iv)(අ) 1. නව ව්‍යාපාරයක් ආරක්ෂා කිරීමේදී. 2. ව්‍යාපාර නවීකරණයේද
3. ව්‍යාපාර අත්පත් කරගැනීමේ. 4. ව්‍යාපාර නැවත ස්ථාපනය කිරීමේදී (ලක්ෂ 2යි)

(ආ) ව්‍යාපාර සැලැස්මක අඩංගු ඇස්තමේන්තු පිරිවැය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශණය ආපසු ගෙවීමේ සටහන මූල්‍ය තත්ව ප්‍රකාශය යනාදිය ඇතුලත් කරන්න. සාරාංශ ගතව දකවන්න. (ලකුණු 2)

(v) (අ) ප්‍රධාන කළමණාකරුවන් :
සංවිධාන ව්‍යුහය
සංවිධානයේ මූලික තනතුරු
මානව සම්පත් වාර්ෂික වියදම (ලකුණු 2)

(ආ) අවශ්‍ය අරමුදල් ප්‍රමාණය නිගමනය
2. ආයෝජනය පිළිබඳ තීරණ ගැනීම
3. මුදල් ඌනතාවයන් හඳුනාගතහැකිවේ.
4. මුදල් අතිරික්තයක් හඳුනාගතහැකිවේ.
5. කාරක ප්‍රාග්ධනය පාලනය. (ලකුණු 2)